# පුරප්පාඩු

## වාරිමාර්ග අමාත්‍යාංශය

## දේශගුණික අවබලපෑම් අවම කිරීමේ බහු අදියර වැඩසටහන් ප්‍රවේශය

## ව්‍යාපෘති ඉංජිනේරු (ප්‍රසම්පාදන) තනතුර සඳහා (CResMPA) බඳවා ගැනීම

## ව්‍යාපෘති කාලසීමාව : අවුරුදු පහ (05) (2022 - 2026)

දේශගුණික අවබලපෑම් අවම කිරීමේ බහු අදියර වැඩ සටහන් ප්‍රවේශය (CResMPA) යනු, ලෝක බැංකුවේ මූල්‍ය සහාය යටතේ වාරිමාර්ග අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන ලෝක බැංකුව විසින් අරමුදල් ප්‍රතිපාදිත ව්‍යාපෘතියකි. එය වනාහි, ගංවතුර හා ජලගැලීම් හා අපවහනවලටගොදුරුවන ජනතාව සහ දේපළ ආරක්ෂාකිරීම සඳහා රට තුළ දේශ ගුණික අවබලපෑම් අවම කිරීම සඳහා බහුරොත්තුදීම් අරගයා වන ජාතික සංවර්ධන ව්‍යාපෘති ප්‍රමුඛ ව්‍යාපෘතිය වන්නේය. ව්‍යාපෘතියේ අරමුණ හා ඉලක්කය වන්නේ, කල්තියා අනතුරු හැඟවීම් දැනුම් දීම් හා වැඩිදියුණු කළ කාලගුණික හා දේශගුණික අනාවැකි පළකිරීමේලා රජයේ හැකියාව වඩා ශක්තිමත් කර තහවුරුකිරීම සහ පහළ කැලණි ද්‍රෝණියේ ගංවතුර අවදානම් තත්ත්වය පහත හෙළීම වන්නේය. ව්‍යාපෘතිය 2021 වසරේ සිට 2026 වසර දක්වා ක්‍රියාත්මකව පවතිනු ඇත.

දේශගුණික අවබලපෑම් අවම කිරීමේ බහු අදියර වැඩසටහන් ප්‍රවේශය හි ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකයේ (PCU) හි පවතින පහත සඳහන් තනතුර සඳහා පූර්ණ කාලීනව "කොන්ත්‍රාත්තු පදනම" මත සේවය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන් වෙතින් මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ.

### ව්‍යාපෘති ඉංජිනේරු (ප්‍රසම්පාදන) තනතුර - තනතුරු එකයි (01)

**අවශ්‍ය සුදුසුකම් හා පළපුරුද්ද :**

**පහත I හෝ II**

I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගනු ලබන සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම

හෝ

අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගනු ලබන සුදුසුකමක්, අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීයමය ආයතනයක් වෙතින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වය / සමාන වෘත්තීයවේදී සුදුසුකමක්

හෝ

සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ, පිළිගත් වෘත්තීයවේදී ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වයක් / සමාන වෘත්තීයවේදී සුදුසුකමක්

සමග

ප්‍රසම්පාදන ක්ෂේත්‍රයේ, අඩුම තරමින් වසර හතක (07) ක පශ්චාත් යෝග්‍යතා පළපුරුද්ද.

II. රජයේ ඒකාබද්ධ සේවයේ III/II පංතියේ හෝ ඉහළ පංතියක, රාජ්‍ය නිලධාරියෙකු වීම හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන තත්ත්වයක් දරන නිලධාරියෙකු වීම.

**රැකියා පැතිකඩ / ප්‍රධාන වගකීම් :**

I. සේවා සහ භාණ්ඩ කොන්ත්‍රාත්තු සඳහා ජාත්‍යන්තර තරඟකාරී මිල ගණන් ICB ප්‍රසම්පාදන මෙහෙයවීම, උපදේශකවරුන් පත්කිරීම සඳහා ජාත්‍යන්තර තරඟකාරී මිල ගණන් ICB ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීම.

II. ලෝක බැංකුව විසින් පළකරනු ලබන සම්මත ප්‍රසම්පාදන ලේඛනවලට අනුව සහ CIDA විසින් පළකරනු ලබන සම්මත ලංසුකරන ලිපිලේඛනවලට අනුව, ලංසුකරන ලිපිලේඛන පිළියෙල කිරීම.

III. ජාත්‍යන්තර උපදේශකවරුන් පත්කිරීම සඳහා ලෝක බැංකුව විසින් පළකරනු ලබන SRFP (සම්මත යෝජනා සඳහා ඉල්ලීම) ලේඛන පරිදි, EOI (අභිලාෂය ප්‍රකාශ කිරීම) සහ RFP (යෝජනා සඳහා ඉල්ලීම) ලේඛන පිළියෙල කිරීම.

IV. ශ්‍රී ලංකාවේ ආණ්ඩුව (GOSL), විසින් පළකරනු ලබන උපදේශන මාර්ගෝපදේශ සහ අත්පොත් සහ උපදේශන නොවන සේවාවන්, කාර්ය හා භාණ්ඩ සඳහා ශ්‍රී ලංකාවේ ආණ්ඩුව (GOSL) පළකරනු ලබන ප්‍රසම්පාදන අත්පොත් හා මාර්ගෝපදේශ සහ ලෝක බැංකුවේ ප්‍රසම්පාදන රෙගුලාසිවලට අනුකූලව වැඩ කිරීමේ හැකියාව.

**වැටුප් මට්ටම :** PS4 (කාණ්ඩය 'අ') රුපියල් 115,000.00 - 130,000.00 (MSD - කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු - චක්‍රලේඛ අංක : 01/2019 පරිදි)

**පොදු කොන්දේසි :**

1. වයස : අයදුම්කරුවන් අවම තරමින් වයස අවුරුදු 21 ට නොඅඩු හා වයස අවුරුදු 62 ට නොවැඩි විය යුතුය.
2. වැටුප් පරිමාණය : 2016-02-25 දිනැති හා අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය සහ 2019-03-15 දිනැති හා අංක : 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව, දීමනාද සහිතව රජයේ අනුමත වැටුප් පරිමාණය.
3. අදාළ ක්ෂේත්‍රයන්හි ලෝක බැංකුවේ / විදේශ අරමුදල් ප්‍රතිපාදිත ව්‍යාපෘතීන් හි අවම තරමින් වසර පහක (05) පළපුරුද්දක් සහිත වීම අනිවාර්ය වේ.
4. මෙම තනතුර සුවිශේෂීවම කොන්ත්‍රාත්තු පදනම මත වන අතර, කාර්ය සාධනය මත පදනම්ව මූලිකව එක් (01) වසරක කාලසීමාවක් දීර්ඝ කරනු ලැබිය හැකිය.
5. අයදුම්පත් ඉදිරිපත් කිරීම :

අයදුම්කරුවන් විසින් ස්වකීය අයදුම්පත් සිය ජීවදත්ත තොරතුරු ප්‍රකාශ (CV) සමග අධ්‍යාපනික, වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද සහ ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ (02), විමසුම් තොරතුරු ද සමග ඉදිරිපත් කළ යුතුය. ස්වකීය ඉහළම සුදුසුකම් හා පළපුරුද්ද මත පදනම්ව කෙටි ලැයිස්තුගත කරනු ලබන අයදුම්කරුවන්, සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලබන අතර, තෝරා ගැනීම කුසලතාවය මත පදනම්ව සිදුකරනු ලැබේ. මූලික සුදුසුකම් සනාථ කිරීම සඳහා වන සහතිකවල සහතික කරන ලද පිටපත් අයදුම්පත සමග අමුණා ඉදිරිපත් කළ යුතුය. අසම්පූර්ණ අයදුම්පත් භාරගැනීම ප්‍රතික්ෂේප කරනු ලැබේ.

කුමන ආකාරයෙන් හෝ අයුතු හා අනිසි බලපෑම් කිරීම නුසුදුසුකමක් වන අතර, එවන් අයදුම්කරුවන්ගේ අයදුම්පත් භාර ගැනීම ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත්, කොළඹ 05, ජාවත්ත පාරේ, අංක 11 හි, දේශගුණික අවබලපෑම් අවමකිරීමේ බහු අදියර වැඩසටහන් ප්‍රවේශය (CResMPA) හි ව්‍යාපෘති අධ්‍යක්ෂක වෙත 2022 ඔක්තෝබර් මස 15 වන දිනට හෝ ඊට පෙර ලැබෙන සේ, ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්කරන තනතුර, ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ, පැහැදිලිව සටහන් කළ යුතුය.

**ලේකම්,**

**වාරිමාර්ග අමාත්‍යාංශය.**